තරුවෙන් ගණිතය...
දිල්ශාන් බී ප්‍රියදර්ශන
grade 6
Final Medal Maths Exam - September

- සැ.යු-පිළිතුරු ලිවීමේදී හිස්තැන් නොතබන්න

1) පහතින් දැක්වෙන වෘත්තයත මත පිහිටි ඉංග්‍රීසි අක්ෂර මොනාද.



1).A,B 2).A,B,C,D 3)C,D

---

2) අගය සොයන්න : 456×7

.....

---

3) "හතලිස්තුන්මිලියනපනස්හතරදහස" යන සංඛ්‍යාව සම්මත ආකාරයෙන් ලියන්න

.....

---

4) පහත ගණක රාමුවෙන් දැක්වෙන දශම සංඛ්‍යාව ලියන්න



.....

LIVEWORKSHEETS

5) පහත දී ඇති ඒකක අතරින් දිග මැනීම සඳහා භාවිතා වන ඒකකය තෝරා ලියන්න

1)ml 2)cm^2 3)kg 4)m

6) සවිධි චතුස්තලයක ඇති දාර ගණන හා ශීර්ෂ ගණන ලියා දක්වන්න

දාර= .....

ශීර්ෂ= .....

7) ගිණිකොන දිශාවට ප්‍රතිවිරුද්ද දිශාව වන්නේ

1)ඊසාන 2)නිරිත 3)බස්නාහිර 4)වයඹ

8) 2050 g, කිලෝග්‍රෑම් වලින් දක්වන්න

.....kg

9) පූර්ණ සංඛ්‍යාවක් ආසන්න දහයේ ගුණාකාරයට වැටයූ විට **50** ලැබේ. එම සංඛ්‍යාව විය හැකි අඩුම සංඛ්‍යාවත් විශාලම සංඛ්‍යාවත් ලියන්න.

අඩුම=.....

විශාලම=.....

10) $\frac{1}{8}$.....$\frac{1}{3}$ හිස්තැනට සුදුසු සංකේතය වන්නේ

1).< 2).> 3).=

සරුවෙන් ගණිතය
දිල්ශාන් බී ප්‍රියදර්ශන

LIVEWORKSHEETS

11) පහතින් දී ඇති එක් එක් ප්‍රකාශය මඟින් දක්වෙන්නේ ඥාතයක්ද, **අඥාතයක්ද** යන්න තෝරන්න

i.ක්‍රිකට් කණ්ඩායමකට අයත් වන ක්‍රීඩකයන් ගණන

1) ඥාතයක් 2) **අඥාතයක්**

ii. බිත්තරයක් බැදීමට පියදාසට අවශ්‍ය වූ ගල් ගෙඩි ගණන

1) ඥාතයක් 2) **අඥාතයක්**

---

12) අභ්‍යාස පොත් 8 ක් මිළ දී ගැනීමට රු. 280 ක් වැය විය. පොතක මිළ සොයන්න

රු.....

---

13) 100 g ක කඩල ඇට 50 ක් පමණ තිබේ. 1 kg ක ඇති කඩල ඇට ගණන නිමානය කරන්න

.....

---

14) පන්තියක ගැහැනු ළමුන් 20 ක් ද පිරිමි ළමුන් 25 ක් ද සිටිති. පන්තියේ සිටින පිරිමි ළමුන් ගණන හා ගැහැනු ළමුන් ගණන අතර **අනුපාතය සරලම ආකාරයෙන් දක්වන්න**

..... : .....

---

15) **සුළු කරන්න**

$$\frac{5}{6} - \frac{2}{3} = \frac{\square}{\square}$$

තරුවෙන් ගණිතය
දිල්ශාන් බී ප්‍රියදර්ශන

LIVEWORKSHEETS

16) 200 ට අඩු 9 හි විශාලතම ගුණාකාරය ලියන්න

.....

17) x=4 නම් පහත ප්‍රකාශනවල අගය සොයන්න.

(i).15+x

.....

(ii).13-x

.....

18) චතුස්තලයක ඇති

(i)මුහුණත් ගණන කීයද

.....

(ii)දාර ගණන කීයද

.....

19) බෝතලයක ජලය 3l තිබුණි. එහි ඇති සිදුරකින් මිනිත්තු 10 ක් තුළ ජලය 150 ml ක් ඉවත් විය . බෝතලයේ ඉතිරිව ඇති ජල ප්‍රමාණය කොපමණද?(ml වලින්)

.....ml

තරුවෙන් ගණිතය
දිල්ශාන් බී ප්‍රියදර්ශන

LIVEWORKSHEETS

20) 25÷3 සුළු කළ විට

(i)ලබ්ධිය කීයද?

.....

(ii)ශේෂය කීයද?

.....

---

2 කොටස

01)



(a)

i. මෙම රූපයේ අඳුරු කර ඇති කොටස මුළු රූපයෙන් කවර භාගයක්ද?

1) $\frac{2}{16}$ 2) $\frac{1}{4}$ 3) $\frac{4}{32}$ 4) $\frac{3}{16}$

ii. එකතු කරන්න:

$$\frac{1}{7}+\frac{2}{7}+\frac{3}{7}=\frac{\boxed{.....}}{\boxed{.....}}$$

තරුවෙන් ගණිතය
දිල්ශාන් බී ප්‍රියදර්ශන

LIVEWORKSHEETS

iii. අඩු කරන්න:

$$\frac{5}{8} - \frac{1}{4} = \frac{\boxed{\ldots\ldots}}{\boxed{\ldots\ldots}}$$

IV. $\frac{1}{2}, \frac{1}{3}, \frac{1}{4}$ යන භාග ආරෝහණ පිළිවෙලට ලියූ විට

1) $\frac{1}{2}, \frac{1}{4}, \frac{1}{3}$ 2) $\frac{1}{2}, \frac{1}{3}, \frac{1}{4}$ 3) $\frac{1}{4}, \frac{1}{3}, \frac{1}{2}$ 4) $\frac{1}{3}, \frac{1}{2}, \frac{1}{4}$

(b)

i. 0.5……0.45 හිස්තැනට සුදුසු ලකුණ වන්නේ

1) < 2) >

ii. අගය සොයන්න 2.5+3.42

.....

තරුවෙන් ගණිතය
දිල්ශාන් බී ප්‍රියදර්ශන

LIVEWORKSHEETS

02)

$\frac{1}{2}$	$\frac{3}{8}$	$\frac{2}{5}$
$\frac{1}{4}$	$\frac{13}{7}$	0.03
0.5	4	$\frac{4}{10}$
$\frac{5}{8}$	$\frac{3}{8}$	1.5

ඉහත කොටුව තුළ ඇති භාග, දශම සංඛ්‍යා අතරින්

(i) ඒකක භාගයක් වන්නේ.

1) $\frac{3}{8}$ 2) 4 3) 1.5 4) $\frac{1}{4}$

(ii) **0.5** ට සමාන භාගයක් වන්නේ.

1) $\frac{2}{5}$ 2) $\frac{1}{4}$ 3) $\frac{1}{2}$ 4) $\frac{2}{1}$

(iii) $\frac{2}{5}$ ට තුල්‍ය සංඛයාව වන්නේ.

1) $\frac{4}{25}$ 2)0.5 3) $\frac{4}{10}$ 4) 0.03

(iv) $\frac{5}{10}$ දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

.....

(v) කොටුව තුළ ඇති දශම සංඛ්‍යා අවරෝහණ පිළිවෙලින් වන්නේ.

..... > ..... > .....

තරුවෙන් ගණිතය
දිල්ශාන් බී ප්‍රියදර්ශන

LIVEWORKSHEETS

(vi) පහත භාග සංඛයා සුළු කල විට අගය සොයන්න

$$\frac{1}{12} + \frac{1}{6} + \frac{1}{3} = \frac{\boxed{\dots\dots\dots}}{\boxed{\dots\dots\dots}}$$

---

(03)

(a). එක්තරා පාසලක ප්‍රධාන ස්ථාන කිහිපයක් පිහිටා ඇති ආකාරය පහත දැක්වේ. එම පිහිටීම් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

(i) ගේට්ටුව පිහිටා ඇත්තේ බුදුමැදුරට කුමන දිශාවෙන්ද ?

1).දකුණ 2).බස්නාහිර 3). නිරිත 4).ඊසාන

(ii) ප්‍රධාන ශාලාවට බස්නාහිරින් පිහිටා ඇත්තේ කුමක්ද ?

1).ළිඳ 2).බුදු මැදුර 3). ගෙට්ටුව 4).පුස්තකාලය

(iii) ළිඳ පිහිටා ඇත්තේ පුස්තකාලයට කුමන දිශාවෙන්ද ?

1).දකුණ 2).බස්නාහිර 3). නිරිත 4).උතුර

(iv) ළමයෙක් පිට්ටනියේ සිට විද්‍යාගාරය දෙස බලා සිටියි. ඔහුගේ වම් අත පිහිටන්නෙ කුමන දිශාවටද ?

1).දකුණ 2).නැගෙනහිර 3). නිරිත 4).උතුර

තරුවෙන් ගණිතය
දිල්ශාන් බී ප්‍රියදර්ශන
LIVEWORKSHEETS

(b)



සංඛ්‍යා රේඛාවේ

(i) P මඟින් නිරූපණය වන අගය ලියන්න.

.....

(ii) Q මඟින් නිරූපණය වන අගය ලියන්න.

.....

(iii) P ___Q හිස්තැනට ගැලපෙන සංකේතය කුමක්ද ?

1) > 2) <

---

(04). **(a)**

(i) **"ඉරට්ටේ සංඛ්‍යාවක් + ඉරට්ටේ සංඛ්‍යාවක්" මඟින් සැම විට ම ලැබෙන්නේ කවර වර්ගයේ සංඛ්‍යාවක් ද?**

1) ඉරට්ටේ 2)ඔත්තේ

(ii) **"ඔත්තේ සංඛ්‍යාවක් × ඔත්තේ සංඛ්‍යාවක්" මඟින් සැම විට ම ලැබෙන්නේ කවර වර්ගයේ සංඛ්‍යාවක් ද?**

1) ඉරට්ටේ 2)ඔත්තේ

(iii) **9** හා **18** අතර ත්‍රිකෝණ සංඛ්‍යා කොපමණක් පවතීද .

.....ක්

තරුවෙන් ගණිතය
දිල්ශාන් බී ප්‍රියදර්ශන
LIVEWORKSHEETS

(iv) ප්‍රථමක සංඛ්‍යාවක් වන ඉරට්ටේ සංඛ්‍යාව කුමක්ද?

.....

(v) 0,1,2,4 යන ඉලක්කම් හතර භාවිතයෙන් ලිවිය හැකි විශාල ම ඔත්තේ සංඛ්‍යාව කුමක්ද?

.....

(b)

පේර ගෙඩියක මිල රු. **x** ද අඹ ගෙඩියක මිල රු. **40** ද වේ.

(i) පේර ගෙඩියක් හා අඹ ගෙඩියක් මිල දී ගැනීමට වැය වන මුදල සඳහා ප්‍රකාශනයක් **x** ඇසුරෙන් ලියන්න.

.....

(ii) පේර ගෙඩියක මිල රු. **15** නම් ඉහත ප්‍රකාශනයේ අගය සොයන්න

රු.....

---

(05)

(a) සාන්තගේ මව පොළට ගොස් ගෙනෙන ලද ද්‍රව්‍ය හා ඒවායේ ස්කන්ධ පහත වගුවේ දැක්වේ

ද්‍රව්‍යයේ නම	ස්කන්ධය
අල	2 kg
ළූණු	1 500 g
මුං ඇට	500 g
කැරට්	1 kg
ලීක්ස්	250 g
අමු මිරිස්	100 g
කෙසෙල්	1 kg 300 g

i) කෙසෙල් වල ස්කන්ධය ග්‍රෑම් වලින් ලියන්න.

.....g

තරුවෙන් ගණිතය
දිල්ශාන් බී ප්‍රියදර්ශන

LIVEWORKSHEETS

ii) ඊෑණු වල ස්කන්ධය කිලෝ ග්‍රෑම් සහ ග්‍රෑම් වලින් ලියන්න.

.....kg	.....g

iii) අල වල ස්කන්ධය කෙසෙල් වල ස්කන්ධයට වඩා කොපමණක් වැඩිද?

.....g

iv)සාන්තගේ මව ගෙනා ද්‍රව්‍ය වල මුළු ස්කන්ධය 8kg නොයික්මන බව ඔහු ප්‍රකාශ කරයි එය සත්‍යද?, අස්ත්‍යද?

1)සත්‍ය වේ 2)අසත්‍ය වේ

(v)අමු මිරිස් 1kg ක මිල රු.440 ක් නම් මිලදී ගත් අමු මිරිස් සඳහා වැය වන මුදල සොයන්න

රු.....

(b) | 2 | 7 | 5 | කාඩ්පත් තුන යොදාගෙන සෑදිය හැකි,

i) විශාලතම සංඛ්‍යාව ලියන්න.

.....

ii) **5 පිහිටි ස්ථානයේ ස්ථානීය අගය**

.....

iii) **5 නිරූපණය වන අගය**

.....

තරුවෙන් ගණිතය
දිල්ශාන් බී ප්‍රියදර්ශන

LIVEWORKSHEETS